සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

21 S I

අවසාන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Final Examination - Grade 13 - 2016**

නම ................................ ආර්ථික විද්‍යාව I කාලය පැය දෙකයි

වැදගත්

**මෙම ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න 50 ක් ඇත. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු, මෙම පත්‍රයෙහි නිසි තැන ලකුණු කරන්න.**

01. පහත දැක්වෙන ඒවා අතුරින් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක සංසිද්ධිය වන්නේ.
    (1). ආර්ථිකයේ ජනගහනය ඉහළයෑම
    (2). ඉන්දියාවේ දළ ජාතික නිෂ්පාදිතය ක්‍රමයෙන් ඉහළයාම
    (3). ශ්‍රී ලංකාවේ වැට් (VAT) බදු 11% සිට 15%, තෙක් ඉහළ යාම නිසා භාණ්ඩ මිල ඉහළ යාම
    (4). ජංගම දුරකථන කාඩ් මිල ඉහළයාම
    (5). රටක් විදේශ වෙළදාමට සම්බන්ධ වීම ( ............... )

02. ආර්ථික සම්පත් යනුවෙන් අදහස් වන්නේ
    (1). නිෂ්පාදන සම්පත් අතුරින් සීමිත සැපයුමක් ඇති හිඟ සම්පත්ය.
    (2). භූමිය ශ්‍රමය ප්‍රාග්ධනය සහ ව්‍යවසාය යන නිෂ්පාදන සම්පත්ය.
    (3). හිඟ සම්පත් භාවිත කර නිපදවන ලද මිලක් සහිත භාණ්ඩ හා සේවාය.
    (4). ස්වභාව ධර්මය විසින් ලබා දී ඇති සියලු සම්පත්ය.
    (5). නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය වන සියලු සම්පත්ය. ( ............... )

03. පහත දැක්වෙන්නේ කෘෂි භාණ්ඩ සහ කාර්මික භාණ්ඩ නිපදවන නිෂ්පාදන හැකියා වක්‍රයකි.




ඉහත වක්‍රයේ නිෂ්පාදන ස්ථානය A සිට B දක්වා ගමන් කිරීමට බලපෑ හැකි සාධකය වන්නේ.
    (1). කෘෂි අංශයේ සේවා වියුක්තිය වැඩිවීම
    (2). සම්පත් ඵලදායිතාවය ඉහළයාම නිසා කෘෂි නිමවුම වැඩිවීම
    (3). ඉල්ලුම වැඩිවීම නිසා කෘෂි නිමවුම වැඩිවීම
    (4). කෘෂි භාණ්ඩ ඒකක 50 ක් ආවස්ථික පිරිවැයකින් නිපදවීම
    (5). විදේශ ගත වූ කෘෂි නිෂ්පාදකයින් නැවත පැමිණීම ( ............... )

04. කිසියම් සමාජයක පුද්ගලයින් ශ්‍රමයට ලබන වැටුප හා දේපොළ අයිතිය මත ලබන ආදායම ඔවුන් විසින් ගන්නා ලද පරිභෝජන තීරණ වෙත වැය කරයි නම්, මින් වඩාත් පැහැදිලි වන්නේ,

(1). වෙළඳපොල ආර්ථිකයක නිෂ්පාදනය තීරණය වන ආකාරයයි.

(2). එරට ජනතාවගේ පරිභෝජන මට්ටම ඉහළ මට්ටමක පවතින බවයි.

(3). වෙළඳපොල ආර්ථිකයක ආදායම හා පරිභෝජනය අතර සිදු කරන තේරීමයි.

(4). විධානගත ආර්ථිකයක පරිභෝජනය තීරණය වන ආකාරයයි.

(5). වෙළඳපොල ආර්ථිකයක් තුළ උපයන ආදායමෙන් වැඩි කොටසක් පරිභෝජනය සඳහා වියදම් කරන බවයි. ( ............... )

05. කිසියම් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත

(1). එක් භාණ්ඩයක නිෂ්පාදනය අඩු නොකොට අනෙක් භාණ්ඩයෙන් නිෂ්පාදනය වැඩි කළ හැකි වේ.

(2). ආර්ථිකයේ නිෂ්පාදන අකාර්යක්ෂමතාවයක් පවතී

(3). පවත්නා සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය වී තිබේ.

(4). තාක්‍ෂණය වෙනස් වෙමින් පවතී.

(5). ඵලදායිතාව වැඩිවීමක් පෙන්නුම් කරයි. ( ............... )

06. විශේෂ ප්‍රාගුණ්‍යය වැඩිවීම නිසා ආර්ථිකය තුළසිදුවිය හැකි ප්‍රතිවිපාකයක් වන්නේ.

1. ඒකක පිරිවැය ඉහළ යාමක්

2. පාරිභෝගික තෘප්තිය ඉහළ යාමක්

3. සාධක ඵලදායිතාව ඉහළ යාමක්

4. මුළු නිෂ්පාදන පිරවැය ඉහළ යාමක්

5. ආන්තික නිෂ්පාදනයේ පහළ යාමක් ( ............... )

07. කිසියම් අඹ නිෂ්පාදකයකු අඹ ගෙඩි 100 ක් නිෂ්පාදනය කළ අතර, අඹ ගෙඩියක් රුපියල් 10 ක් බැගින් අලවි කරන ලදි. මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය - 2.0 ක් වූ අතර ඊළඟ අඹ වාරයේදී අඹ මිල 20% කින් පහළ ගියේනම් දෙවන අඹ වාරයේ දී ගොවියා ලැබූ අයභාරය.

(1). රුපියල් 100 කින් වැඩිවෙයි. (2). රුපියල් 520 කින් ඉහළයයි

(3). රුපියල් 180 කින් පහළයයි (4). රුපියල් 120 කින් ඉහළයයි

(5). රුපියල් 480 කින් ඉහළයයි ( ............... )

08. කිසියම් භාණ්ඩයක මිලරුපියල් 50 ක සිට 62.50 දක්වා ඉහළ ගිය අතර වෙනත් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය ඒකක 40 ක සිට ඒකක 20 ක් දක්වා අඩු වී තිබේ. නම් මෙම භාණ්ඩයට අදාළ ආර්ථික විද්‍යාත්මක සංකල්පය වන්නේ,

(1). නම්‍යතාවය 2.0 ක් වන අතර ආදේශ භාණ්ඩ වේ.

(2). නම්‍යතාවය 0.5 ක් වන අතර අනුපූරක භාණ්ඩ වේ.

(3). නම්‍යතාවය 2 ක් වන අතර අනුපූරක භාණ්ඩ වේ.

(4). නම්‍යතාවය 0.5 ක් වන අතර අදේශක භාණ්ඩවේ.

(5). නාම්‍යතාවය 2.5 ක් වන අතර අනුපූරක භාණ්ඩවේ. ( ............... )

09.



ඉහත රූප සටහනට අනුව S හා $S_1$ සැපයුම් වක්‍ර වල A ලක්ෂයේ සැපයුම් නම්‍යතාවය වන්නේ පිළිවෙලින්

1. ESP = 2.5 සහ 0.62 2. ESP = 0.8 සහ 1.5
3. ESP = 1.0 සහ 0.8 4. ESP = 0.62 සහ 2.5
5. ESP = 1.5 සහ 0.8 ( ............... )

10. QD = 600 - 10 P QS = 100 + 10 P

ඉහත වෙළඳපොලට අදාළ භාණ්ඩය සඳහා රජය විසින් අවම මිලක් ලෙස රු. 40 ක් නියම කරන ලදි. අධි සැපයුම් ප්‍රමාණය රජය මිලදී නොගන්නේ නම් භාණ්ඩයේ වෙළෙඳපොල මිල කොපමණ වේද?

1. රු. 40 ක් වේ. 2. රු. 10 ක් වේ. 3. රු. 20 ක් වේ.
4. රුපියල් 25 ක් වේ. 5. රුපියල් 15 ක් වේ. ( ............... )

11. කිසියම් භාණ්ඩයක් සඳහා වන සමතුලික වෙළඳපොලක් පහත දැක්වේ.




මෙම භාණ්ඩයෙන් ඒකක 20 ක් අලෙවි කිරීමෙන් නිෂ්පාදකයා අපේක්ෂා කරන අවම ආදායම කොපමණද?

1. රු. 80 2. රු. 180 3. රු. 120 4. රු. 40 5.රු. 160

( ............... )

12. කිසියම් කාල පරිච්ඡේදයක් තුළ කිසියම් භාණ්ඩයක් සඳහා වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත දැක්වේ.

| P | QD | QS |
|---|---|---|
| 80 | 500 | 900 |
| 70 | 600 | 800 |
| 60 | 700 | 700 |
| 50 | 800 | 600 |

මෙම භාණ්ඩයේ ඒකකයක් මත රු. 10 ක ඒකක බද්දක රජය විසින් නිෂ්පාදකයාට පනවන ලදි. බද්දෙන් පසුව රුපියල් 70 දී අධි සැපයුම කොපමණ වේද?

1. 200 කි 2. -200 කි 3. 100 කි 4. -100 කි
5. 300 කි ( ............... )

13. එක්තරා භාණ්ඩයක වෙළෙඳපොල ඉල්ලුම් ශ්‍රිතය Qd = 20 - 2P ද අධි ඉල්ලුම් ශ්‍රිතය ED = 30 - 6P ද වේනම් වෙළඳපොල සමතුලිකයේදී නිෂ්පාදන අතිරික්තය වන්නේ

(1). 25 (2). 22.50 (3). 12.50 (4). 75.00 (5). 25.50

( ............... )

14. එක්තරා භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර රූප සටහනක් පහත දැක්වේ.




සමතුලිත ප්‍රමාණය Q සිට $Q_1$ දක්වා පහළ යාම සඳහා බලපෑ හේතු ඇතුළත් පිළිතුර වන්නේ,

1. නිෂ්පාදන සහනාධාරයක් හා පාරිභෝගික බද්දක්
2. පිරිවැය ඉහළයාමක් හා අනුපූරක මිල අඩුවීමක්
3. තාක්‍ෂණ දියුණුවීමක් හා පාරිභෝගික ආදායම අඩුවීමක්
4. නිෂ්පාදන බද්දක් හා ආදේශක භාණ්ඩ මිල පහළ යාමක්
5. අනුපූරක මිල වැඩිවීමක් හා පාරිභෝගික රුචිය අඩුවිමක් ( ............... )

15. පහත රූප සටහනේ දැක්වෙන ආයතනය සම්බන්ධයෙන් ඔබට එකඟ විය හැකි ප්‍රකාශය තෝරන්න.




(1). ආයතනයේ ලාභ උපරිම වන්නේ $E_1$ ලක්‍ෂයට අදාළ නිමැවුම් මට්ටමේදීය.
(2). E ලක්ෂ්‍යට අදාළ නිමැවුම් මට්ටමේදී ආයතනය ආර්ථික ලාභයක් උපයයි
(3). E ලක්ෂ්‍යට අදාළ නිමැවුම් මට්ටමේදී ආයතනය ආර්ථික අලාභයක් උපයයි.
(4). ආයතනයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය E ලක්ෂයේ සිට ඉහළට බෑවුම් වන ආන්තික පිරිවැය වක්‍රය වේ.
(5). ආයතනයේ අවම සැපයුම් මිල P වේ. ( ............... )

16. ශ්‍රමයේ ආන්තික ඵලදාව එහි සාමාන්‍ය ඵලදාවට සමානවන විට
(1). ශ්‍රමයේ ආන්තික ඵලදාව උපරිම වේ.
(2). නිෂ්පාදනයේ ආන්තික පිරිවැය සහ සාමාන්‍ය පිරිවැය ශූන්‍ය වේ.
(3). නිෂ්පාදනයේ ආන්තික පිරිවැය, අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වේ.
(4). සාමාන්‍ය මුළු පිරිවැය අවම අගයක් ගනී.
(5). මුළු ඵලදාව උපරිම අගයක් ගනී. ( ............... )

17. පූර්ණ තරගකාරී ආයතනයක් සතියකට භාණ්ඩ ඒකක 200 ක් ඒකකයක් රු. 250 බැගින් අලෙවි කරයි. එම ආයතනයේ පිරිවැය පහත පරිදි වේ.

| | |
|---|---|
| මුළු ස්ථාවර පිරිවැය | 20000 |
| මුළු විචල්‍ය පිරිවැය | 60000 |
| ආන්තික පිරිවැය | 200 |

කෙටිකාලයේදී ලාභ උපරිම කිරීමට හෝ අලාභ අවම කරගැනීමට හෝ මෙම ආයතනය කුමක් කළ යුතුද?

(1). නිෂ්පාදනය මුළුමනින්ම අත්හිටුවීම
(2). නිමැවුම ප්‍රසාරණය කිරීම
(3). නිමැවුම් සංකෝචනය කිරීම
(4). මිල ඉහළ නැංවීම
(5). වර්තමාන මට්ටමේ නිමැවුම් පවත්වාගැනීම ( ............... )

18. පූර්ණ තරගාකාරී නිෂ්පාදන ආයතනයක් සතුව පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් පවතී. යන්නෙන් අදහස් කරනුයේ.

(1). එමආයතනයට පවත්නා මිල යටතේ අපරිමිත ප්‍රමාණයක් සැබවින්ම අලෙවි කළ හැකි බවයි.
(2). ආයතනයේ නිමැවුම වැඩි කරන විට ආන්තික පිරිවැය නොවෙනස්ව පවතින බවය.
(3). මිල ඉහළ නැංවීමෙන් ආයතනයට තම මුළු අයභාරය ඉහළ නංවාගත හැකි බවයි.
(4). නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය කොපමණ වුවද ආයතනයේ මුළු අයභාරය ස්ථාවරව පවතින බවය.
(5). ආයතනය නිපදවන කවර නිමැවුම් මට්ටමකදී වුවද භාණ්ඩයේ මිල නොවෙනස්ව පවතින බවයි.

( ............... )

19. ප්‍රාමාණික ලාභ ලෙස හඳුන්වන්නේ,

(1). වර්ෂ කීපයක් මුලුල්ලේ නිෂ්පාදන ආයතනයක් උපයන සාමාන්‍ය ලාභ ප්‍රමාණයයි
(2). වර්ෂ කීපයක් මුලුල්ලේ කර්මාන්තයක් උපයන සාමාන්‍ය ලාභයයි.
(3). නිෂ්පාදන සම්පත් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීමට අවශ්‍ය කරන ලාභ ප්‍රමාණයයි.
(4). නිෂ්පාදන ආයතනයක් සමතුලිත මට්ටමේ තබා ගැනීමට අවශ්‍ය කරන ලාභ ප්‍රමාණයයි.
(5). සාමාන්‍ය අයභාරය ආන්තික අයභාරයට සමාන වන අවස්ථාවේ උපයන ලාභයයි.

( ............... )

20. කිසියම් වර්ෂයකදී වෙළෙඳමිල යටතේ ගණනය කරන ලද දළ ජාතික නිෂ්පාදිතය දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට වඩා අඩුවිය හැක්කේ,

(1). ශුද්ධ වක්‍රබදු ඍණ අගයක් ගැනීම
(2). ශුද්ධ විදේශ සාධක ආදායම ඍණ අගයක් ගැනීම
(3). ශුද්ධ අපනයන ඍණ අගයක් ගැනීම
(4). විදේශ සම්පත් පරතරය ඍණ අගයක් ගැනීම
(5). ශුද්ධ වක්‍රබදු ධන අගයක් ගැනීම ( ............... )

21. යම් වර්ෂයකදි රටක ජනතාව ජාතික ආදායමට වඩා වියදම් කරනු ලබයි නම් එම තත්වය පිළිඹිබු කරන දර්ශකය කුමක්ද?

(1). රාජ්‍ය වියදම් ඉහළයාම
(2). විදේශ ආයෝජන ආදායම් පහළ වැටීම
(3). ශුද්ධ අපනයන ඍණ අගයක් ගැනීම
(4). ආදායම් ප්‍රමාණය සංකෝචනය වීම
(5). ශුද්ධ විදේශ සංක්‍රාම ඍණ අගයක් ගැනීම. ( ............... )

22. වියදම් ප්‍රවේශය යටතේ ඇතුළත් වීම නිසා දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම අධිතක්සේරු වීමට බලපෑ හැකි සාධකය කුමක්ද?

(1). ස්ථාවර ප්‍රාග්ධන වියදම් (4). පරිභෝජනය මත කරන වියදම්
(2). දෙවන වරට අලෙවි වන භාණ්ඩ මිලට ගැනීම මතකරණ වියදම්
(3). අවසාන භාණ්ඩ මත කරන වියදම් (5). තොග වෙනස් වීම් ( ............... )

23. පහත සඳහන් ආදායම් ශීර්ෂ වලින් ජාතික ආදායමට ඇතුළත් නොකරන ආදායම් ශීර්ෂය වන්නේ,

(1). සමාගම් වල නොබෙදූ ලාභ (2). ගොවීන්ගේ ශුද්ධ ඉපයීම්

(3). කුටුම්භ වල ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රජයෙන් හිමිවන දීමනා

(4). සංගීත ශිල්පියෙකුට ගී තනු නිර්මාණය කිරීම වෙනුවෙන් ලැබෙන ආදායම්

(5). මූල්‍ය ප්‍රාග්ධනය සැපයූ අයට ව්‍යාපාරිකයින් විසින් පොලී ගෙවීම් ( ............... )

24. ව්‍යාපාර චක්‍රයක පතුලේ සිට මුදුනත දක්වා ගමන් කළ විට දැකිය හැකි තත්වයකි.

(1). සැබෑ නිමවුම වැඩිවේ සේවා නියුක්තිය වැඩ වී උද්ධමනය ඇතිවේ.

(2). සැබෑ නිමවුම වැඩිවේ සේවා නියුක්තිය අඩු වී උද්ධමනය අඩුවේ.

(3). සැබෑ නිමවුම වැඩිවේ සේවා නියුක්තිය වැඩ වී උද්ධමනය අඩුවේ.

(4). විභව නිමවුම වැඩිවේ සේවා නියුක්තිය අඩු වී උද්ධමනය ඇතිවේ.

(5). විභව නිමවුම වැඩිවේ සැබෑ නිමවුම අඩුවී උද්ධමනය අඩුවේ. ( ............... )

25. ජාතික ගිණුම්කරනයේ දී වැටුප් + පොලී + ලාභ + දේපොල ආදායම් + ගෙවුම් ශේෂයේ ප්‍රාථමික ආදායම් ශේෂය එකතු කළ විට ලැබෙන ජාතික ගිණුම් සදංකල්පය වන්නේ,

(1). දළ ජාතික ආදායම (2). ශුද්ධ දේශීය නිස්පාදිතය

(3). ශුද්ධ දේශීය ආදායම (4). දළ ජාතික නිෂ්පාදිතය ( ............... )

(5). ජාතික ආදායම

26. කිසියම් රටක නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 1600 ක් ද මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. මිලියන 1200 ක්ද වේ නම් එරට දළ දේශීය නිෂ්පාදිතයේ අවධනමක දර්ශකයේ අගය මිලියන කොපමණද?

(1). 0.75 (2). 133.3 (3). 75 කි

(4). 1.66 කි (5). 220 කි ( ............... )

27. සාර්ව ආර්ථික විග්‍රහය තුළ "සමතුලිත නිමවුම් මට්ටම" නිවැරදිව අර්ථ කථනය වන්නේ කෙසේද?

(1). පවත්නා අගයේ සිට ඉහළට හෝ පහළට වෙනස් වීමකින් තොරව පවත්වා ගත හකි කුමන හෝ නිමවුම් මට්ටමකි.

(2). ඌණ සේවා නියුක්ති මට්ටමට වඩා වැඩි ස්ථාවරව පවත්වා ගත හැකි නිමවුම් මට්ටමකි.

(3). නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත තීරණය වන උච්චාවචනයකින් තොර නිමවුම් හෝ ආදායම් මට්මකි.

(4). පවත්නා සේවා නියුක්ති මට්ටම අවම උච්චාවචන මට්ටමක පවත්වා ගැනිමයි.

(5). පූර්ණ සේවා නියුක්ති මට්ටම හෝ ඊට ඉහළ සමතුලිත නිමවුම් මට්ටමකි. ( ............... )

28. කල්පික සරල ආර්ථිකයක පරිභෝජනයේ සිදු වූ වෙනස හේතුවෙන් පරිභෝජන වක්‍රය වෙනස් වූ ආකරය පහත පරිදි වේ.



මෙම රූප සටහනට අනුව එකඟ වියහැකි ප්‍රකාශය වන්නේ.

| | ජාතික ආදායම | ආන්තික පරිබෝජන නැම්යාව | සාමාන්‍ය ඉතුරුම් නැම්යාව |
|---|---|---|---|
| 1 | වැඩිවේ | අඩුවේ | වෙනස් නොවේ |
| 2 | අඩු වේ | වැඩි වේ | අඩු වේ |
| 3 | වැඩි වේ | වෙනස් නොවේ | අඩුවේ |
| 4 | වෙනස් නොවේ | වෙනස් නොවේ | වැඩි වේ |
| 5 | අඩුවේ | වැඩි වේ | අඩු වේ |

( ............... )

29. පරිභෝජන ශ්‍රිතය $C = 100 + 0.8\,yd$ වන සංවෘත ආර්ථිකයක රජයේ මිලදී ගැනීම් රු. බිලියන 30 කින් ඉහළ නැංවූ අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම සඳහා ස්වාධීන බදු රු. බිලියන 35 කින් ඉහළ නංවන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස,
    (1). සමතුලිත ජාතික ආදායම රු. බිලියන 100 කින් ඉහළ යයි.
    (2). සමාහාර ඉල්ලුම රු. බිලියන 30 කින් පහළ යයි.
    (3). සමතුලිත ජාතික ආදායම රු. බිලියන 100 කින් පහළ යයි.
    (4). සමාහාර ඉල්ලුම රු. බිලියන 10 කින් ඉහළ යයි.
    (5). සමාහාර ඉල්ලුම වෙත කිසිදු බලපෑමක් නොවේ. ( ............... )

30. සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 30 + 0.6\ y$ හා $y = 1000$ වන්නේ නම්, ආර්ථිකයේ ආයෝජන මට්ටම වන්නේ,
    (1). 630 (2). 2500 (3). 370
    (4). 3000 (5). 600 ( ............... )

31. සරල ආර්ථිකයක ආන්තික පරිභෝජන නැම්යාව 0.6 කි. ආයෝජන රු. බිලයන 150 කින් වැඩිකළ විට සමතුලිත ආදායම ප්‍රසාරණය වන්නේ,
    (1). රු. මිලියන 375 කිනි (2). රු. මිලියන 15 කිනි
    (3). රු. මිලියන 60 කිනි (4). රු. මිලියන 9 කිනි
    (5). රු. මිලියන 68 කිනි ( ............... )

32. නිෂ්පාදනයේ බාහිර පිරිවැය යටතට ඔබ ඇතුළත් කරන පිරිවැය වර්ගය වන්නේ,
    (1). නිෂ්පාදනයේ පෞද්ගලික ගිණුම්වල ඇතුළත් වන පිරිවැයයි.
    (2). නිෂ්පාදනයක් හේතු කොටගෙන බාහිර අයට ලැබෙන වාසියයි.
    (3). නිෂ්පාදකයාට දැරීමට සිදුනොවන බාහිර සමාජය වෙත පැවරෙන පිරිවැයයි.
    (4). නිෂ්පාදනය වෙනුවෙන් බාහිර පාර්ශ්වයෙන් මිලට ගන්නා නිෂ්පාදන සාධක පිරිවැයයි.
    (5). නිෂ්පාදයින්ට පාලනය කළ නොහැකි නියගය වැනි බාහිර පිරිවැයයි. ( ............... )

33. රාජ්‍ය අයවැයේ වර්තන ගිණුමේ හිගයක් මගින් අදහස් වන්නේ
    (1). වර්තනවියදම් පියවා ගැනීමට රාජ්‍ය ඉතුරුම් පවතින බවයි.
    (2). රාජ්‍ය ඉතුරුම් ධන අගයක් ගන්නා බවයි.
    (3). රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණිය යුතු බවයි.
    (4). රජයේ ප්‍රාග්ධන වියදම් අඩුකිරීමට සිදුවන බවයි.
    (5). රජයේ පවත්නා ආර්ථික කටයුතු පවත්වා ගැනීමට ණය ගත යුතු බවයි. ( ............... )

34. රාජ්‍ය අය වැය හිගයක් මගින් උද්ධමනාත්මක ප්‍රතිවිපාක ඇති නොවන ණය මාර්ගය හඳුනාගන්න.
    (1). මහ බැංකුවෙන් ණය ගැනීම (2). රක්ෂණ ආයතන මගින් ණයගැනීම

(3). සම්පත් බැංකුවෙන් ණය ගැනීම (3). විදේශ වලින් ණය ගැනීම

(5). වාණිජ බැංකු මගින් ණයගැනීම ( ............... )

35. පොදු සම්පත් යනුවෙන් අදහස් කරන්නේ. පහත දැක්වෙන කුමන භාණ්ඩ වර්ගයද?

(1). පරිභෝජනයේ තරග කාරිත්වයක් ඇති පරිභෝජනය සීමාකළ නොහැකි භාණ්ඩවේ.

(2). පරිභෝජනයේ තරගයක් නැති පරිභෝජනය සීමාකළ හැකි භාණ්ඩ වේ.

(3). සාමූහිකව පරිභෝජනය කළ හැකි භාණ්ඩයකි.

(4). පරිභෝජනයේ තරගකාරිත්වයක් නැති ලෝක ප්‍රජාවටම පරිභෝජනය කළ හැකි භාණ්ඩයකි.

(5). පරිභෝජනයේ ධන භාහිරතා ඇති සමාජ ප්‍රතිලාභ වැඩි භාණ්ඩයකි. ( ............... )

36. අතිරේක පුද්ගලයෙකු සඳහා ශුද්ධ පොදු භාණ්ඩයක් සැපයීමේදී සමාජ ආන්තික පිරිවැය

(1). අනන්ත වේ. (2). දැරීමට සිදුවේ.

(3). සෘණ අගයක් ගනී. (4). ශුන්‍ය අගයක් ගනි. (5). ධණ අගයක් ගනී.

( ............... )

37. පහත සංරචක අතුරින් $M_2b$ මුදල් සමස්තයේ සංරචකයක් නොවන්නේ මින් කුමක්ද?

(1). බලපත්‍ර ලාභී විශේෂ බැංකු වල පෞද්ගලික තැන්පතු

(2). එතෙර බැංකුවල නේවාසිකයන්ගේ තැන්පතු

(3). මහජනයා නමින් ඇති වාණිජ බැංකුවල ඉතුරුම් තැන්පතු

(4). මහජනයා සතු ජංගම ගිණුම් ශේෂ

(5). මහජනයා සතු ව්‍යවහාර මුදල් ( ............... )

38. පුද්ගලයෙකු රුපියල් 4800 ක මුදලක් වානිජ බැංකුවක ජංගම ගිණුමක තැන්පත් කරන ලදි. සංචිත අනුපාතය 20% ක් නම් මෙම තැන්පතුව මත ණය මැවීම සම්පූර්ණ කළ විට පද්ධතියට මැවිය හැකි උපරිම ණය ප්‍රමණය කොපමණද?

(1). රු. 22200 (2). රු. 18200 (3). රු. 19200

(5). රු. 24000 (5). රු. 16200 ( ............... )

39. වාණිජ බැංකුවක ලාභදායිත්වය සීමාකාරීවීම කෙරේ බලපාන සාධකය හදුනා ගන්න.

(1). අධි සංචිත නොපැවතීම. (2). ප්‍රාථමික සංචිත අඩුවිම

(3). පොලි අනුපාත අඩුවීම (4). ද්විතීය සංචිත අඩුවිම

(5). ද්‍රවශීලතාව ඉහළ මට්ටමක පැවතීම. ( ............... )

40. රටක අපනයන තරගකාරිත්වය ඉහළ යා හැක්කේ

(1). එම රටේ ඉහළ උද්ධමනයක් පවතින විට

(2). අනෙකුත් රටවලට වඩා එම රටේ උද්ධමනය වැඩි වන විට

(3). විදේශ මුදල් ඒකකයකට ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ගණන අඩුවන විට.

(4). විදේශ මුදල් ඒකකයකට ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ගණන ඉහළ යාම

(5). අපනයන සඳහා ඉහළ ඉල්ලුමක් පවතින විට ( ............... )

41. ගෙවුම් ශේෂ ලේඛනයේ සංයුතියෙහි සිදුවි තිබෙන ප්‍රධාන වෙනස්කමකි.

(1). භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය වෙනස්කොට දැක්වීම

(2). ජංගම හා මුල්‍ය ගිණුම ඒකාබද්ධ කිරිම

(3). ජංගම සංක්‍රාම ගිණුම ප්‍රාථමික ආදායම් ගිණුම ලෙස නාමකරණය කිරීම

(4). ප්‍රාග්ධන හා මුල්‍ය ගිණුම වෙන්කොට දැක්වීම

(5). වර්තන ගිණුම උප ගිණුම් 4 ක් දක්වා වැඩි කිරීම ( ............... )

42. ඔබට එකඟ විය නොහැකි ප්‍රකාශය කුමක්ද?

(1). ආනයන මත තීරු බදු පැනවීම සමාජ සුභසාධනයට හානි වේ.

(2). සම්පත් සම්භාරයේ උරුමයන් මත රටකට ලැබෙන සාපේක්ෂ වාසි වෙනස්විය හැක.

(3). ආනයන යෙදවුම් මත තීරුබදු පැන වූ විට සඵල ආරක්ෂණ අනුපාතය පහළ වැටේ.

(4). අපනයන හා ආනයන ඉල්ලුම අනම්‍ය වේ නම් විනිමය අනුපාතය ක්ෂයවීම ගෙවුම් ශේෂයට හිතකර වේ.

(5). අපනයන මිලට වඩා ආනයන මිල ඉහළ යනවිට වෙළඳ අනුපාතය පහළ වැටේ. ( ............... )

43. අබාධ වෙළඳාම යටතේ දේශීය නිෂ්පාදන ඒකකයක ඇතුළත් එකතු කළ අගය රු. 2000 කි. ආනයනික හිමි භාන්ඩයේ දේශීය වෙළඳපොල ඒකකයක මිල රු. 4000 කි. ආනයනික නිමි භාණ්ඩය මත 10% ක තීරුබද්දක් සහ ආනයනක යෙදවුම් මත 5% ක තීරු බද්දක් පනවයි නම්,

| | ආනයන යෙදවුම් මත තීරු බදු රහිත සඵල ආරක්ෂන අනුපාතය % | යෙදවුම් මත තීරුබදු යටතේ සඵල ආරක්ෂණ අනුපාතය |
|---|---|---|
| (1). | 25 | 10 |
| (2). | 20 | 15 |
| (3). | 15 | 20 |
| (4). | 10 | 25 |
| (5). | 22 | 15 |

( ............... )

44. විදේශ විනිමය වෙළඳපොලේ ලංකාවේ රුපියල් සඳහා ඉල්ලුම හා සැපයුම පහත රූප සටහනේ දැක්වේ.




ඉහත සැපයුම් වක්‍රය S සිට $S_1$ දක්වා විතැන් වීමට බලපෑ හැකි හේතුව වන්නේ.

(1). ඇමරිකානු සංචාරකයින් වැඩියෙන් ලංකාවට පැමිණීම

(2). ඇමරිකාවට කරනු ලබන ඇඟලුම් අපනයන ඉහළයෑම

(3). කොළඹ කොටස් වෙළඳපොලේ ඇමරිකානු ආයෝජන ඉහළ යෑම

(4). ශ්‍රී ලාංකිකයන් ඇමරිකාවේ සංචාර සඳහා යොමු විම.

(5). ශ්‍රී ලංකාවේ අපනයන වලට සහනාධාරදීම. ( ............... )

45. ඇමරිකා එක්සත් ජනපද $ කර්මාන්ත වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම රු. 120 ක සිට 96 දක්වා වෙනස්වේ නම්, මේ සඳහා පහත ප්‍රකාශ වලින් කවර ප්‍රකාශය සත්‍ය වේද?

(1). ඇඟලුම් ඇමරිකාවට අපනයනයේදී එහි මිල අඩුවනු ඇත.

(2). ඇමරිකාවෙන් ලංකාවට ගෙන්වන රෙදි පිළි මිළ අඩුවනු ඇත.

(3). ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව අගය ඉහළ ගොස් ඇත.

(4). USA ඩොලරයට සාපේක්ෂව $ රුපියල ක්ෂය වී ඇත.

(5). USA වලට යන ශ්‍රී ලංකා සංචාරකයින්ට වාසි වනු ඇත. ( ............... )

46. මානව සංවර්ධනය මිනුම කිරීමේදී යහපත් ජීවන තත්වයක් සඳහා අවශ්‍ය කරන සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.

1. යහපත් සෞඛ්‍ය තත්වය, යහපත් ජීවිතයකට අවශ්‍ය දෑ යහපාලනය
2. තේරීමේ නිදහස ආරක්ෂාව සහ යහපත් සමාජ සම්බන්ධතා

3. තේරීමේ නිදහස යහපාලනය හා ආරක්ෂාව
4. යහපත් සමාජ සම්බන්ධතා ආරක්ෂාව හා පාරිසරික සුරක්ෂිතතාව
5. පාරිසරික සුරක්ෂිත බව යහපාලනය හා තේරීමේ නිදහස ( ............... )

47. තිරසාර සංවර්ධනය සඳහා ආර්ථික සංවර්ධනයට අතිරේකව අපේක්ෂා කරනුයේ,
1. දරිද්‍රතාවය අවම කිරීම හා පරිසර සුරක්ෂිත බවය.
2. සාධාරණ ආදායම් ව්‍යාප්තිය හා ආර්ථික කාර්යක්ෂමතාවය
3. ආර්ථික ව්‍යුහමය වෙනස්කම් හා ආර්ථික ස්ථායිතාවය
4. පිරිසර සුරක්ෂිත බව හා ආර්ථික ව්‍යුහමය වෙනස්කම්ය.
5. සමාජ සංවර්ධනය හා පරිසර සුරක්ෂිත බවය. ( ............... )

48. 2015 න් පසු ජාත්‍යන්තර දරිද්‍රතා ඉම ලෙස සැලකෙන ආදායම වන්නේ.

(1). $1.09 කි. (2). $1.90 කි. (3). $1.25 කි.

(4). $1.00 කි. (5). $1.52 කි. ( ............... )

49. වර්තමාන 2012 / 2013 නව සමීක්ෂණය අනුව වැඩිම දරිද්‍රතාවන් ඇති පළාත සහ දිස්ත්‍රික්කය ඇතුළත් පිළිතුර ලෙස ඔබ සලකන්නේ.

| | පළාත | දිස්ත්‍රික්කය |
|---|---|---|
| (1). | උතුර | මුලතිව් |
| (2). | ඌව | බදුල්ල |
| (3). | උතුර | කිලිනොච්චි |
| (4). | ඌව | මුලතිව් |
| (5). | නැගෙනහිර | මොණරාගල |

( ............... )

50. ලෝක බැංකු වර්ගීකරණයට අනුව ඒකපුද්ගල ආදායම මත රටවල් වර්ග කිරීමේදී පහළ ආදායම් ලබන රටවල් ලෙස සලකන්නේ පහත කුමන ආදායම් මට්ටමකින් පහළ රටවල් ද?

(1). $975 (2). $75 (3). $1025

(4). $4125 (5). $1045 ( ............... )